# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2158/18 - 2020 ජනවාරි මස 14 වැනි අඟහරුවාදා - 2020.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විදුලිබල රාජ්‍ය අමාත්‍යවරයා සහ බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයා සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීම, විදුලිබල හා බලශක්ති විෂයභාර කැබිනට් අමාත්‍යවරයා ලෙස මාගේ අධීක්ෂණයට, සහ මග පෙන්වීමට යටත්ව මෙහි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි වහාම ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද අමරවීර,<br>
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2020 ජනවාරි මස 14 වැනි දින.

**උපලේඛනය**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා,**<br>
**විදුලිබල රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *I වන තීරුවේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජීවන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය<br>2. සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>3. ග්‍රාමීය විද්‍යුත්නය<br>4. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම | 1. ලංකා විදුලිබල සමාගම<br>2. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම<br>3. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | • ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35) |

1A - G 31809 — 392 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**ගරු පී. රෝහිත අබේගුණවර්ධන මැතිතුමා,**
**බලශක්ති රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *I වන තීරුවේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වාභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම<br>2. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන කටයුතු තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම<br>3. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 1. සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය<br>2. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම | |

01 - 702

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.